03 යම්කිසි ප්‍රදේශයකට ගැලපෙන බෝග තෝරාගැනීමටත්, බෝග අස්වනු වැඩිකර ගැනීමටත්, අහිතකර කාලගුණ තත්ත්ව නිසා සිදුවන බෝග පාළුවීම අවම කර ගැනීමටත් එම ප්‍රදේශයේ දේශගුණය හා කාලගුණික පාරමිතික පිළිබඳව දැන සිටීම වැදගත් වේ.

(1) බෝග වගාවේදී වැදගත් දේශගුණික සාධක 3 ක් ලියන්න. (ල. 03)

(2) ශ්‍රී ලංකාවට වර්ෂාපතනය ලැබෙන ක්‍රම 3 ක් ලියන්න. (ල. 03)

(3) බෝග වගාවට බලපාන උෂ්ණත්වයේ අහිතකර බලපෑම් 2ක් මොනවාද? (ල. 02)

(4) මුහුදු මට්ටමේ සිට ඇති උස අනුව ප්‍රධාන දේශගුණික කලාප උප කලාපවලට වෙන්කර ඇත. එම දේශගුණික කලාප දෙකක් ලියන්න. (ල. 02)

04 පසක් නිර්මාණය වන්නේ පාෂාණවලිනි. පාෂාණ ජීර්ණය මගින් පාංශු මාතෘ ද්‍රව්‍ය නිර්මාණය වේ.

(1) පාෂාණ හා ඒවායේ සම්භවය අනුව වර්ග 3 කට නම් කරන්න. (ල. 03)

(2) භෞතික ජීරණයට බලපාන සාධක 3 ක් ලියන්න. (ල. 03)

(3) පාංශු ජලය පවතින ආකාර 3ක් ලියන්න .(ල. 03)

(4) පාංශු ජීවීන් කෙටියෙන් හඳුන්වන්න. (ල. 01)

05 බොහෝ බෝග වර්ග වගා කිරීමේදී බීජ හෝ වර්ධක කොටස් තවාන් කර ලබාගන්නා පැළ ක්ෂේත්‍රයේ සිටුවන අතර සමහර බෝගවල බීජ එක්වරම ක්ෂේත්‍රයේ සිටවනු ලැබේ.

(1) තවාන් වර්ග 3 ක් ලියන්න. (ල. 03)

(2) තවානකට සුදුසු ස්ථානයක් තේරීමේ දී සැලකිළිමත් විය යුතු කරුණු 3 ක් ලියන්න. (ල. 03)

(3) තවාන් මිශ්‍රණයේ අඩංගු ද්‍රව්‍ය හා එහි අනුපාතය ලියන්න. (ල. 03)

(4) තවාන් ජීවාණුහරණය කරන ක්‍රම 2 ක් ලියන්න. (ල. 01)

06 වර්තමානයේ ජලය සීමිත සම්පතක් වන බැවින් එය මතු පරපුර වෙනුවෙන් මනාව කළමනාකරණය කළ යුතු වන අතර අතීතයේ ද ජල කළමනාකරණය කෙරෙහි ඉහළ අවධානයක් තිබූ බවට සාක්ෂි ඇත.

(1) බෝගවලට ජල සම්පාදනයේදී සැලකිය යුතු කරුණු 3ක් ලියන්න. (ල. 03)

(2) උප පෘෂ්ඨීය ජල සම්පාදන ක්‍රම 2 ක් ලියන්න. (ල. 02)

(3) ජල වහනයේ වාසි 2ක් ලියන්න. (ල. 02)

(4) ජලවහන කාණු රටා 3 ක් ඇඳ පෙන්වන්න. (ල. 03)

07 ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රධාන ආහාරය වූ බත සපයනු ලබන්නේ වී ශාකයෙනි.

(1) වී වගාව ශ්‍රී ලංකාවට වැදගත් වන කරුණු 3 ක් ලියන්න. (ල. 03)

(2) ගොයම් පැළැටියේ වර්ධන අවධි 3 ක් ලියන්න. (ල. 03)

(3) වැඩි දියුණු කළ වී ප්‍රභේද අභිජනනයේදී සලකා බලන මුලික කරුණු 4ක් ලියන්න. (ල. 04)

**10 ශ්‍රේණිය** **අවසාන වාර පරීක්ෂණය 2015** **කෘෂි හා ආහාර තාක්ෂණය 1/2**

## පිළිතුරු පත්‍රය - I පත්‍රය

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01. (3) | 02. (2) | 03. (4) | 04. (2) | 05. (4) | 06. (2) | 07. (4) | 08. (3) | 09. (4) | 10. (3) |
| 11. (3) | 12. (2) | 13. (1) | 14. (3) | 15. (2) | 16. (3) | 17. (1) | 18. (4) | 19. (1) | 20. (3) |
| 21. (2) | 22. (2) | 23. (4) | 24. (4) | 25. (4) | 26. (4) | 27. (3) | 28. (4) | 29. (3) | 30. (3) |
| 31. (1) | 32. (1) | 33. (2) | 34. (4) | 35. (4) | 36. (2) | 37. (3) | 38. (1) | 39. (2) | 40. (3) |

## II පත්‍රය

(1 x 40 = 40)

01 (1) රතු දුඹුරු පස
දියලු පස

(2) <u>හායනයට හේතු</u> :
පසේ තද බව ඇතිවීම , පස ආම්ලික හෝ ක්ෂාරීය වීම , පාංශු ඛාදනය

. (3) පාංශු අවකාශ අඩුවීම / ශාක මුල්වල පැතිරීමට බාධා ඇතිවේ. /ක්ෂුද්‍ර ජීවී වර්ධනයට බාධා ඇතිවේ.
කාබනික ද්‍රව්‍ය ජීර්ණය වීමේ හැකියාව අඩුවේ. /ජල වහනය දුර්වල වේ /සී සෑමට අපහසු වේ.

(4) <u>අහිතකර බලපෑම්</u>
ශාක වර්ධනය සඳහා සුදුසු පාංශු ස්ථරයේ ඝනකම අඩුවේ. /ශාක පෝෂණ ඌනතාවලට ගොදුරු වී වර්ධනය බාලවේ. /මුල මණ්ඩල අවට පස සෝදායාම /ගස් ඇදවැටීම /ගංවතුර ඇතිවීම

(5) විසිරි ඛාදනය , ස්ථරීය ඛාදනය , ඇලි ඛාදනය , ඇඟිලි ඛාදනය , දියපහර ඛාදනය

(6) හායනයට ලක් වූ පසක් නැවත බෝග වගා කළ හැකි තත්ත්වයට පත් කිරීමයි.

(7) පස් අංශු එකිනෙකින් වෙන්වීම අවම කිරීම.
පස් අංශු ප්‍රවාහනය අවම කිරීම.

(8) ප්‍රයෝජන අනුව / වැඩෙන පරිසරය අනුව / බෝගවල වර්ධන විලාසය අනුව/
බෝගවල වයස අනුව

(09) ප්‍රාථමික බිම් සැකසීම / ද්විතීයික බිම් සැකසීම

(10) බිම් සැකසීමේදී / පොහොර යෙදීමේදී / බද්ධ කිරීම සඳහා ශාක තෝරා ගැනීමේදී /
රසායනික වල් නාශක භාවිතයේදී / පලිබෝධ පාලනයේ දී

02 (1) වැව් බැම්ම, සොරොව්ව, බිසෝ කොටුව, වැව් ඉස්මත්ත , පිටවාන

(2) ගල්ඔය යෝජනා ක්‍රමය , /උඩවලව යෝජනා ක්‍රමය , / නිල්වලා යෝජනා ක්‍රමය , / ලුණු ගම්වෙහෙර යෝජනා ක්‍රමය , / මහවැලි යෝජනා ක්‍රමය , / ඉඟිනිමිටිය යෝජනා ක්‍රමය , / මුතුකණ්ඩිය ව්‍යාපාරය , මව් ආර ව්‍යාපාරය.

(3) කෙටි කලකින් වැඩි අස්වනු ලබා දෙන බීජ නිපදවීම / කෘෂි රසායනික ද්‍රව්‍ය හඳුන්වාදීම.
යාන්ත්‍රිකරණය වැඩිවීම. /ධාන්‍ය නිෂ්පාදනය දෙගුණයකින් වැඩිවීම. /අලෙවි කිරීමට පෙළඹීම.

(4) ආහාර සුලභතාව / ප්‍රවේශවීමේ හැකියාව / ප්‍රයෝජනයට ගැනීම.

03. (1) වර්ෂාපතනය / ආලෝකය / සුළඟ / උෂ්ණත්වය / සාපේක්ෂ ආර්ද්‍රතාව

(2) මෝසම් වැසි / සංවහන ක්‍රියා / වාසුලි වැසි

(3) පූටිකා වැසි උත්ස්වේදනය අඩුවේ. /උත්ස්වේදනය වැඩි වී ශාක මැලවේ. / පුෂ්ප හා පරාග වියලේ /සෙල යුෂය මිදීම / පත්‍ර පිළිස්සීම.

(4) උඩරට උච් 900 m / මැද රට උච් 300 900 m අතර / පහත රට උච් 300 m අඩු

04. (1) ආග්නේය පාෂාණ / අවසාදිත පාෂාණ / විපරිත පාෂාණ

(2) උෂ්ණත්වය වෙනස්වීම / ජලය මිදීම / ගලායන ජලය / රැළි ක්‍රියා / සුළඟ / සතුන් / මිනිසා / ශාඛ මුල්

(3) ගුරුත්වාකර්ෂණ ජලය / කේශාකර්ශන ජලය / ජලාකර්ෂණ ජලය

(4) පසේ ජිවත්වන සියලුම ජීවින් පාංශු ජීවීන් වේ. ඇසට පෙනෙන ජීවින මෙන්ම පියවී ඇසට නොපෙනන ජීවින් ද හට ඇතුළත් වේ.

05. (1) නොරිදෝතෝ තවාන / බඳුන් තවාන් /තැටි තවාන් / උස් වූ තවාන් / ගිල් වූ තවාන්

(2) නිතර අවධානය යොමු වූ තැනක් වීම. / හිරු එළිය හොඳින් ලැබෙන තැනක් වීම / ජලය ලබා ගැනීමට පහසු තැනක් වීම / සමතලා තැනක් වීම / ජල වහනය හොඳින් සිදුවන තැනක් වීම / අධික සුළං නොමැති තැනක් වීම / රෝගී වගාවක් නොතිබුණු තැනක් වීම / ප්‍රවාහන පහසුකම් තිබීම.

(3) මතුපිට පස් : ගොම / කොම්පෝස්ට් 1 : 1